# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2005 අංක 11 දරන සමිති ආඥාපනත (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2005 මැයි මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 මැයි මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල :** රු. 4.25 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

# 2005 අංක 11 දරන සමිති ආඥාපනත (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2005 මැයි මස 06 වන දින]

එල්. ඩී.–ඕ. 101/2002.

**සමිති ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2005 අංක 11 දරන සමිති ආඥාපනත (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. (123 වන අධිකාරය වූ) සමිති ආඥාපනතේ (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 123 වන අධිකාරයේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ " සමිතියේ අභිමතය පරිදි" සිට එම උපවගන්තියේ අවසානය දක්වා ඇති වචන වෙනුවට "දිසා අධිකරණයේ පවරන නඩුවකින් අයකර ගනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "දෙදහස් පන්සියයක්" යන වචන වෙනුවට " ලක්ෂ පහක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ " දෙදහස් පන්සියයක් යන වචන වෙනුවට "ලක්ෂ පහක්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ (8) වන උපවගන්තියේ " වයස අවුරුදු විසිඑකට අඩු එහෙත් වයස අවුරුදු දහසයට වැඩි" යන වචන වෙනුවට "වයස අවුරුදු දහඅටට අඩු එහෙත් වයස අවුරුදු දහසයට වැඩි" යන වචන ආදේශ කිරීමෙන්.

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ " මුළු මුදල වශයෙන් රුපියල් දෙදහසකට වැඩි මුදලක් සහ යම් බෝනස් මුදලක් හෝ ඒ මුදලට වැඩි නොවන රක්ෂණ මුදල් මත ප්‍රකාශයට පත් කරන ලද එකතු කළ මුදලක් හෝ වාර්ෂික මුදල් වශයෙන් රුපියල් පන්සියයක් " යන වචන වෙනුවට " මුළු මුදල වශයෙන් රුපියල් විසිපන් දහසකට වැඩි මුදලක් සහ යම් බෝනස් මුදලක් හෝ එකී මුදලට වඩා වැඩි නොවන, රක්ෂණය මත ප්‍රකාශයට පත් කරන ලද මුදලක් හෝ වර්ෂයකට රුපියල් පන්දහසක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

2–P. L. 000068–4,500 (2005/02)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.